ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>ජනතා විමුක්ති පෙරමුණේ මහ ලේකම් ටිල්වින් සිල්වා මැතිතුමා ඉන්දියාවේ සංචාරයක නිරත වේ</u>

ජනතා විමුක්ති පෙරමුණේ මහ ලේකම් ටිල්වින් සිල්වා මැතිතුමා සංස්කෘතික සබඳතා සඳහා ඉන්දියානු කවුන්සිලයේ (ICCR) සම්භාවනීය අමුත්තන්ගේ වැඩසටහන (Distinguished Visitors Programme) යටතේ 2026 පෙබරවාරි 5-12 දක්වා ඉන්දීය සංචාරයක නිරත විය. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කිට්නන් සෙල්වරාජ් මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉලන්කුමාරන් කරුණානාදන් මහතා, ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික ජානක අධිකාරි මහතා, ජනතා විමුක්ති පෙරමුණේ මාධ්‍ය ඒකකයේ ප්‍රධානි හේමතිලක ගමගේ මහතා සහ ජනතා විමුක්ති පෙරමුණේ ජාත්‍යන්තර සබඳතා දෙපාර්තමේන්තුවේ සාමාජිකා කල්පනා මධුභාෂිණී මහත්මිය ද ටිල්වින් සිල්වා මැතිතුමා සමඟ මෙම සංචාරයට එක් වූහ. මෙම දූත පිරිස නව දිල්ලිය, අහ්මදාබාද් සහ තිරුවානන්තපුරම් වෙත සංචාරය කළහ. මෙය ටිල්වින් සිල්වා මැතිතුමාගේ පළමු ඉන්දීය සංචාරය වේ.

2. නව දිල්ලියේ පැවති තිල නියැලීම්වල කොටසක් ලෙස ජනතා විමුක්ති පෙරමුණේ ලේකම්තුමා විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා සහ නියෝජ්‍ය ජාතික ආරක්ෂක උපදේශක පවන් කපූර් මැතිතුමා හමු වූහ. ඉන්දියාවේ ‘අසල්වැසියා ප්‍රථමයෙන්’ යන ප්‍රතිපත්තිය සහ ‘මහාසාගර්’ (MAHASAGAR) දැක්ම අනුව ඉන්දියාව සැම විටම ශ්‍රී ලංකාව සඳහා සැබෑ සහ විශ්වාසවන්ත මිතුරකු ලෙස රැඳී සිටින බව ඉන්දියානු පාර්ශ්වය විසින් සහතික කරන ලදී. දෙරටෙහිම ප්‍රතිලාභය අරමුණු කර ගනිමින් වර්ධනය සඳහා පවතින අවස්ථාවන් සහ සමාජ සුබසාධන මුලපිරීම් පිළිබඳව සාකච්ඡාවන්හි අවධානය යොමු විය. පුළුල් පරාසයක පැතිර තිබෙන සංස්කෘතික කටයුතු සහ ICCR විසින් ශ්‍රී ලාංකේය සිසුන්ට පිරිනමන විවිධ ශිෂ්‍යත්ව සම්බන්ධයෙන් දූත පිරිස දැනුවත් කරන ලදී.

3. දූත පිරිස ඉන්දියාවේ අනන්‍ය ඩිජිටල් අනන්‍යතා අධිකාරිය, ජාතික ආපද කළමනාකරණ අධිකාරිය, ගති ශක්ති සහ ඉන්දීය කෘෂිකර්ම පර්යේෂණ ආයතනය වෙත ද සංචාරය කළහ. නව දිල්ලි සංචාරය අතරතුරදී ඩිජිටල් සහ භෞතික යටිතල පහසුකම්, ආපද සූදානම සහ ප්‍රතිචාර, යටිතල පහසුකම් සංවර්ධන ප්‍රයත්නයන් සහ තිරසාර කෘෂිකාර්මික ක්‍රමවේද යනාදිය තුළ ඉන්දියාවේ තාක්ෂණික ශක්තිය සම්බන්ධයෙන්

සමස්තයක් වශයෙන් අවබෝධයක් ලබා දෙන ලදී. දූත පිරිස දරෙට අතර සියවස් ගණනාවක් මුලුල්ලේ පවතින ශිෂ්ටාචාරමය බැඳීම අවධාරණය කරමින් පූජනීය පිප්රාහ්ව සර්වඥ ධාතු ප්රදර්ශනය ද නැරඹීමට එක් වූහ.

4. අහ්මදාබාද් සංචාරය අතරතුරදී දූත පිරිස ගුජරාට් මහ ඇමති ශ්රී භූපේන්ද්ර පටෙල් මැතිතුමා සහ නියෝජ්‍ය මහ ඇමති ශ්රී හර්ෂ් සංඝවි මැතිතුමා වෙන් වෙන් වශයෙන් හමු වූහ. දෙපාර්ශ්වය විසින් කිරි ආශ්‍රිත නිෂ්පාදන, යටිතල පහසුකම්, සමූපකාර ක්ෂේත්‍රය, මූල්‍ය තාක්ෂණය, සංචාරක කර්මාන්තය, නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය යන අංශ තුළ ගුජරාටය විසින් ක්‍රියාත්මක කර තිබෙන අන්තර්ග්‍රහණීය සංවර්ධන ආකෘතිය පිළිබඳව සාකච්ඡා කරන ලදී. සංචාරය අතරතුරදී, දූත පිරිස AMUL, ත්‍රිභුවන් සහකාරී විශ්වවිද්‍යාලය, ගුජරාට් ජාත්‍යන්තර මූල්‍ය තාක්ෂණ නගරය (Gujarat International Finance Tec-City) සහ ව්‍යවසායකත්වය සහ තාක්ෂණය සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (International Centre for Entrepreneurship and Technology – i-Create) යන ආයතන වෙත ද සංචාරය කළහ. දූත පිරිස මහත්මා ගාන්ධි සබර්මති ආශ්‍රමය වෙත ද ගියහ.

5. තිරුවානන්තපුරම් සංචාරය අතරතුරදී ටිල්වින් සිල්වා මැතිතුමා සහ දූත පිරිස කේරළ මහ ඇමති ශ්රී පිනරයි විජයන් මැතිතුමා හමු වූහ. ඔවුහු වික්‍රම් සාරාභායි අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ ද සංචාරයක නිරත වෙමින් අභ්‍යවකාශ විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ දියුණුව පිළිබඳව අවබෝධයක් ලබා ගත්හ. එසේම, දූත පිරිස රාජ්‍ය - පෞද්ගලික ආකෘතිය යටතේ සංවර්ධනය කරන ලද ඉන්දියාවේ ප්‍රථම ගැඹුරු ජල බහාලුම් අන්තර් නැව්ගතකරණ වරාය (deep-water container transshipment port) වන විසිංජම් වරාය වෙත ද සංචාරය කළහ.

6. ජනතා විමුක්ති පෙරමුණේ මහ ලේකම් ටිල්වින් සිල්වා මහතා ප්‍රමුඛ දූත පිරිසේ සංචාරය ඉන්දියාව විසින් ශ්රී ලංකාවේ විවිධ දේශපාලන පක්ෂවල නායකයන් සමඟ පවත්වන නිරන්තර නියැලීම්වල කොටසකි.

****

**කොළඹ**

***2026* පෙබරවාරි *12***